- **පෙළපොත භාවිතා කොට අසා ඇති සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **විෂයභාර ගුරුභවතාට යොමුකර පිළිතුරු තහවුරු කර ගන්න.**

I කොටස

1. බුදුන් හා දහම් සරණ ගිය පළමු දේවවාචික උපාසකවරු වන්නේ කවුරුන්ද?
2. අභිධර්මය මෙනෙහි කිරීමත් සමඟ ම බුද්ධ ශරීරයෙන් බුදුරැස් විහිදෙන්නට පටන් ගත්තේ කී වෙනි සතියේද?
3. ලෝකයාට ධර්මය දෙසන ලෙසට බුදු රජාණන් වහන්සේට ආරාධනා කළේ කවුද?
4. "ඔබේ ශාස්තෘවරයා කවරෙක්ද? ඔබ රුචි කරන ධර්මය කුමක්දැයි" බුදු රජාණන් වහන්සේගෙන් විමසුවේ කවුද?
5. සෝවාන් බවට පත්වූ පළමු රජතුමා වන බිම්බිසාර රජතුමා විසින් සාදවා පූජා කරන ලද ආරාමය කුමක්ද?
6. සිරිත් විරිත් පැහැදිලි කරන සිරිත් මල්දම කෘතිය රචනා කළේ කවුරුන්ද?
7. සම්බුදු දහම ඇතුලත් ත්‍රිපිටකයට අයත් ධම්ම පදය අයත් වන්නේ කුමන නිකායටද?
8. බුදු සසුනේ අග්‍රදායිකාව යන විරුදාවලිය ලබා ගැනීමට සමත්වූ කාන්තාව කවුද?
9. අසරණ අයට පිහිටවූ බැවින් අනේපිඬු හෙවත් අනාථ පිණ්ඩික ලෙසින් හැඳින්වූ සිටුතුමාගේ නම කුමක්ද?
10. පස්වග තවුසන් රහත් බවට පත්වූයේ කුමන සූත්‍රය අසාද?
11. ජේතවනාරාමයේ ගත කරන ලද වස්කාල ගණන කීයද?
12. බුදු රජාණන් වහන්සේ තම පළමුවන ධර්ම දේශනාව පැවැත්වූයේ කවර පොහොය දිනයකද?
13. බුදු රජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ අවස්ථාවක් නම් කරන්න.
14. මල මිනියකට තබා ගැට ගසා අමු සොහොනේ දමා ගොස් තිබුණේ කවුද?
15. මෛත්‍රිය වැඩිය යුතු ආකාරය දැක්වෙන සූත්‍රය කුමක්ද?
16. මිගාරා මාතා නමින් හැඳින්වෙන්නේ කවුද?
17. බුදුගුණාලංකාරය යන කෘතිය රචනා කලේ කවුරුන්ද?
18. බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ නොසිටින අවස්ථාවල වැඳපුදා ගැනීමට රෝපණය කළ බෝධි අංකුරය හැඳින්වූ නම කුමක්ද?
19. සැරියුත් මහ රහතන් වහන්සේගේ ගිහි නම කුමක්ද?
20. මහියංගන දාගැබෙහි තැන්පත් කර ඇත්තේ කුමන ධාතූන් වහන්සේලාද?

II කොටස

1.
   i. බිම්බිසාර රජුගේ බලාපොරොත්තු 5 අතුරින් 2 ක් නම් කරන්න.
   ii. සත් සතියෙන්, හයවන සතියේදී සිදුවූ වැදගත්ම සිදුවීම් 2 ක් නම් කරන්න.
   iii. ඒහි භික්ඛු භාවයෙන් පැවිදි කළ දෙදෙනෙකු නම් කරන්න.
   iv. අනේපිඬු සිටුතුමා සහ විශාඛා සිටු දේවිය පූජා කළ ආරාම 2 නම් කරන්න.
   v. මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග 2 ක් නම් කරන්න.
   vi. කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිශංස ගණන කීයද?
   vii. බුද්ධත්වයෙන් පසු බරණැසට වඩින අතර බුදුන් වහන්සේට හමුවූ පුද්ගලයා කවුද?
   viii. ප්‍රථම ධර්ම දේශනය අසා මුලින්ම සෝවාන් වූයේ කවුද?
   ix. අගසව් දෙනම නම් කරන්න.
   x. බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදුවූයේ කොහාටද?

2.
   i. බුදුරජාණන් පිහිටවූ අසරණ අය දෙදෙනෙක් නම් කරන්න.
   ii. ඉන් එක් අවස්ථාවක් ඔබේ වචනයෙන් ලියන්න.
   iii. උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 5 ක් ලියන්න.

3.
   i. කාව්‍යශේඛරය රචනා කළේ කවුද?
   ii. "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ" යන කවිය සම්පූර්ණ කරන්න.
   iii. නිවසේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 5 ක් නම් කරන්න.

4.
   i. තුන් සූත්‍රය නම් කරන්න.
   ii. මෛත්‍රී භාවනාව වැඩිය හැකි ඉරියව් 4 ක් නම් කරන්න.
   iii. ඔබ ප්‍රගුණ කර ඇති භාවනාවක් වඩන ආකාරය විස්තර කරන්න.

5.
   i. සත් සතියෙන් 2 ක් නම් කරන්න.
   ii. පස්වග තවිසන් නම් කරන්න.
   iii. සත් සතිය ගත කරන අවස්ථාවල සිදුවූ වැදගත් සිදුවීම් කිහිපයක් නම් කරන්න.

6.
   i. ගරුකළ පුද්ගලයන්ට ගරු නොකිරීම නිසා බුදුහිමි අවවාද දුන් භික්ෂුව නම් කරන්න.
   ii. අනුසෝතගාමී බව සහ පටිසෝතගාමී බව කෙටියෙන් පහදන්න.
   iii. "අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය." යන අදහස ඇති ගාථාව ලියන්න.

7. කෙටි සටහන් ලියන්න.
   i. විශාඛා සිටු දේවිය
   ii. අනේපිඬු සිටුතුමා
   iii. නව අරහාදී බුදුගුණ
   iv. කරණීය මෙත්ත සූත්‍රය

www.lkedu.lk